චක්‍ර ලේඛ අංක: 37/2013

මාගේ අංකය:ඩබ්/01/විවිධ/2013,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09
2013.10.14 වන දින,

සියළුම බන්ධනාගාර අධිකාරින් /සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත.

## ආගමික පූජකතුමන්ලාගේ සංචිතයක් සැකසීම

බන්ධනාගාර රැඳවියන් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන තුල ඔවුන් ආගමට දහමට නැඹුරු කිරීම සඳහා ලබා දී ඇත්තේ සුවිශේෂී ස්ථානයකි. ඒ අනුව මේ වන විට එකී කාර්ය ඉටුකිරීමෙහිලා ඔබ ආයතනයට දැනටමත් බාහිරින් කැඳවනු ලබන සර්ව ආගමික පූජකතුමන්ලා විසින් මෙම ආගමික සේවාව නොපිරිහෙලා ඉටුකරනු ලබයි.

නමුත් මේවන විට රැඳවියන්ගේ ආගමික සේවාව සඳහා යැයි පවසමින් බන්ධනාගාරය තුලට පැමිණෙන සමහර පූජකවරුන් රැඳවියන්ගේ සහ එම පවුල් තුල ඇති අසරණ භාවය ප්‍රයෝජනයට ගෙන ඉතා රහසිගතව මෙන්ම සංවිධානාත්මකව අන්‍යආගම්වලට හැරවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වන බව දැනගැනීමට ලැබී ඇත. විශේෂයෙන්ම රැඳවියන්ගෙන් තොරතුරු ලබාගෙන එම නිවෙස්වලට ගොස් ඔවුන්ට ජිවත්වීමට හා ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට සහ එම පවුල්වල වෙනත් අවශ්‍යතාවයන්ට මැදිහත්වෙමින් ඔවුන්ට උපකාර කරන බව හඟවමින් එම පවුල්වල සාමාජිකයින් ද එකී ආගම්වලට සංවිධානාත්මකව බඳවාගන්නා තත්වයක් උද්ගතවී තිබීම කණගාටු දායකය.මෙම තත්වය වහාම නතරකල යුතුව ඇත.

එබැවින් ,ඒ සඳහා ඔබ ආයතනයේ නේවාසිකයින්ගේ ආගමික ප්‍රබෝධය සඳහා නිරතුරුවම සද්භාවයෙන් යුතුව ක්‍රියාකරන බෞද්ධ,හින්දු,කතෝලික/ක්‍රිස්තියානි සහ මුස්ලිම් පූජකවරුන්ගේ පැහැදිලි සංචිතයක් වහාම සකස්කර එකී සංචිතය පිළිබඳව තොරතුරු (පූජකතුමන්ගේ නම,විහාරස්ථානය/සිද්ධස්ථානය,ජා:හැ අංකය) 2013.10.20 වන දිනට පෙර ඔබගේ ද නිර්දේශය සහිතව අනුමැතිය සඳහා මාවෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

තවද, ඔබ විසින් නිර්දේශිත සංචිතයේ ආගමික පූජකවරුන් හැර එතුමන්ලාගේ අවසරය නොමැතිව කිසිම බාහිර පූජකවරයකුට මින් ඉදිරියට බන්ධනාගාරය තුල ආගමික වතාවත් හෝ රැඳවියන් ගේ පවුල්වල සුභ සාධන කටයුතු සඳහා මැදිහත්වීමට අවසරය ලබා නොදිය යුතුය. යම්කිසි අවස්ථාවක දි විශේෂ ආගමික වැඩ සටහනක් සඳහා බාහිර පූජකවරයකු ආගමික සේවාව සඳහා ආයතනයට කැඳවන්නේ නම් අදාල අනුමත ආගමික පූජකුම්ාගේ අවසරය හා ඔබගේ නිර්දේශය මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන පමණක් එකී ආගමික වැඩ සටහන් ක්‍රියාත්මක කලයුතු බව වැඩි දුරටත් දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්